# සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය - රුවන්වැල්ල

## පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා සමිති බල ප්‍රදේශයේ ප්‍රමුඛතා අනුපිළිවෙලට කෑගල්ල දිස්ත්‍රික්කයේ වසර දෙකක ස්ථිර පදිංචි, වයස අවුරුදු 18 ත් - 45 ත් අතර (සමුපකාර සමිතිවල දැනට සේවය කරන අයට වයස් සීමාව බලපාන නොලැබේ) අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2025.11.28 දින දක්වා කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **තනතුර** | : | **ඉන්ධනහල් කළමනාකරු (මෙහෙයුම් 1 ශ්‍රේණිය)** |
| **වැටුප් ක්‍රමය** | : | රු. 34,000.00 - 10 X 300.00 - 10 X 310.00 - 40,100.00 |
| **පන්තිය** | : | III |
| **පුරප්පාඩු සංඛ්‍යාව** | : | 01 |

**සුදුසුකම් :**

I. ගණිතය, සිංහල / දෙමළ ඇතුළුව විෂයන් 06 කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙ.) එකවර සමත් වීම සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම. (ඉංග්‍රීසි සමත් වීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ)

හෝ

II. ජාතික සමුපකාර මණ්ඩලය මගින් පිරිනමන කළමනාකරණය පිළිබඳ සහතිකය සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක ගබඩා පාලනය පිළිබඳ වසර 01 කට නොඅඩු පළපුරුද්ද තිබීම

හෝ

III. ජාතික සමුපකාර මණ්ඩලය මගින් පිරිනමන උසස් පෙළ සහතිකය සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක ගබඩා පාලනය පිළිබඳ වසර 02 කට නොඅඩු පළපුරුද්ද තිබීම

හෝ

IV. ජාතික සමුපකාර මණ්ඩලය මගින් පිරිනමන සා.පෙ. සහතිකය සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක ගබඩා පාලනය පිළිබඳ වසර 03 කට නොඅඩු පළපුරුද්ද තිබීම

හෝ

V. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සමග පොම්පකරු වශයෙන් වසර 10 ක පළපුරුද්ද තිබීම.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාම සේවා සහතිකය, හැඳුනුම්පත, පළපුරුද්ද පිළිබඳ සහතිකය, සේවා සහතික හා වෙනත් සුදුසුකම් සහතික වල ඡායා පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**"ගරු සභාපති, සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය, රුවන්වැල්ල."**


**ගරු සභාපති,**
**සී/ස රුවන්වැල්ල වි.සේ.ස. සමිතිය,**
**රුවන්වැල්ල.**
**2025.11.14**
**036-2266392 / 0362267345**